# අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**10/11 ශ්‍රේණි සඳහා වීඩියෝ පාඩම් මාලාවේ ක්‍රියාකාරකමට අදාළ පිළිතුරු**

**10 ශ්‍රේණිය - පරිච්ඡේදය 04 - ගිණුම්කරණය හැඳින්වීම**

**ගිණුම්කරණය හැඳින්වීම**

.........................................................................................................

**01.**

1. ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශ්වවලට තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය ගිණුම්කරණය යනුවෙන් හැඳින්වේ.

2. ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා වැදගත් වන මූල්‍යමය තොරතුරු සැපයීමට පවතින ගිණුම්කරණය මූල්‍ය ගිණුම්කරණය යනුවෙන් හැඳින්වේ.

3. අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයන්, සැපයුම්කරුවන්, තරගකරුවන්, රජය, ප්‍රජාව මූල්‍ය ආයතන

4. ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වවලට තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීම ගිණුම්කරණයේ ප්‍රධානතම අරමුණ වේ.

5.
   i. ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේ ද යන්න දැන ගැනීම.
   ii. ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය සතුටුදායක ද යන්න දැන ගැනීම.
   iii. නීතිමය අවශ්‍යතා ඉටු කිරීම.
   iv. ගනුදෙනු අමතක වීම හා අතපසු වීම ආදිය තුළින් සිදුවිය හැකි අවාසි අවම කර ගැනීම.
   v. මූල්‍ය කටයුතු ක්‍රමවත් කර ගැනීම.

6. ගිණුම්කරණයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ගිණුම්කරණය මගින් ඇල්මැති පාර්ශ්ව වෙත සපයනු ලබන විවිධ වාර්තා මූල්‍ය ප්‍රකාශ යනුවෙන් හැඳින්වේ.

**02.**

(අ). සත්‍යයි
(ආ). අසත්‍යයි
(ඉ). සත්‍යයි
(ඊ). සත්‍යයි
(උ). අසත්‍යයි
(ඌ). සත්‍යයි

**03.**

1. (1)
2. (1)
3. (4)
4. (1)